ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
සමාජ විද්‍යා පදනම් පාඨමාලාව - 2 වන මට්ටම 2007/2008
අවසාන පරීක්ෂණය
කළමණාකරනය හැඳින්වීම : SSF 2302

කාලය : පැය තුනයි (03)

දිනය :2008.09.28 වේලාව : ප.ව. 1.30 - ප.ව. 4.30

ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න. සෑම පිළිතුරක් සඳහාම ලකුණු විස්සක් (20) ලැබේ.

1) සංවිධානයක් තුළ සන්නිවේදන ක්‍රියාවලිය යනුවෙන් කුමක් අදහස් වේදැයි විස්තර කරන්න. (ලකුණු 20)

2) (a) සංවිධානයක පොදු අභිවෘද්ධිය සඳහා එහි සේවය කරන්නාවූ අය තුළ කාල කළමණාකරනය පිළිබඳව හොඳ අදහසක් තිබිය යුතුය. සාකච්ඡා කරන්න. (ලකුණු 10)
(b) පැරටෝගේ 80/20 සිද්ධාන්තයේ වැදගත්කම පැහැදිළි කරන්න. (ලකුණු 10)

3) සංවිධානකරණය නම් වූ සංකල්පය නූතන යුගයේ අවශ්‍යතා මුදුන් පත්කරවා ගැනීමට ඌවහල් වන අයුරු පහත සඳහන් කොටස් ආශ්‍රිතව සාකච්ඡා කරන්න.

(a) සංවිධානකරණය නම් වූ සංකල්පයේ වැදගත්කම. (ලකුණු 06)
(b) ශ්‍රී ලංකාවේ පිහිටි සංවිධානවල පවතින තත්වය (ලකුණු 08)
(c) සංවිධාන .තුළ කළමණාකරණයේ වැදගත්කම (ලකුණු 06)

4) (a) "උද්යෝගිමත් නොවන සේවක පිරිසක් තුළින් සංවිධානයකට සෙතක් සිදු නොවේයි" මෙම ප්‍රකාශය අභිප්‍රේරණය නම් වූ සංකල්පය ආශ්‍රිතව සාකච්ඡා කරන්න. (ලකුණු 10)
(b) මැස්ලෝගේ අවශ්‍යතාවයන්ගේ ධුරාවලිය තුළ ඇති මූලික ලක්ෂණ මොනවාද? (ලකුණු 10)

5) (a) සංවිධානයක් තුළ අධිකාරිය යනුවෙන් කුමක් අදහස් වේදැයි පහදන්න. (ලකුණු 12)
(b) රේඛීය අධිකාරය සහ මාණ්ඩලික අධිකාරය අතර ඇති වෙනස කුමක්දැයි පැහැදිළි කරන්න. (ලකුණු 08)

6) (a) සංවිධාන සටහනක් ඇඳ, එතුළින් සිදුවන කාර්ය භාරය විස්තර කරන්න. (ලකුණු 10)
(b) පාලන අවකාශය නම් වූ සංකල්පයෙන් සිදුවන මෙහෙය කුමක්ද? (ලකුණු 10)

7) කළමනාකරණ ක්‍රියාවලිය පිලිබඳව ඔබ දන්නාවූ ගුරු කුල හය (6) මොනවාද?
එම ගුරුකුල අතර ඇති වෙනස්කම් මොනවාද?

(ලකුණු 20)

8) නූතන සංවිධාන තුළ සැලසුම්කරණයට දිය යුත්තේ විශේෂ තැනකි.
සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

9) ශ්‍රී ලාංකික සංවිධාන තුළ ගුණාත්මක වශයෙන් වැඩි දියුණුවක් ලැබීමට කළමණාකරුවන්
හට නායකත්ව කුසලතා තිබිය යුතුමය. සාකච්ඡා කරන්න. (ලකුණු 20)

***** සියළුම හිමිකම් ඇවිරිණි *****